
ආරම්භය: 1945 -09-30 ලි.ප. අංකය: කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසලොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් කරන
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව

# බෞද්ධෝදය



"ධම්මො හවේ රකඛති ධම්මචාරි"

70 වර්ෂය - ශ්‍රී බු.ව 2559 | 2015 ඔක්තෝම්බර් 27 | වප් කලාපය

**රත්මලාන ශ්‍රී ධර්මාරාම පුරාණ විහාරවාසී
රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති
පූජ්‍ය කොටනෙළුමේ පුඤ්ඤානන්දහිමිපාණෝ**

## බුදුරජාණන් වහන්සේටත් විපාක දුන් කර්ම විපාක.
## (පළමු කොටස - 01-06)

**"කරන කලට පව් මීරිය මීසේ- විඳින කලට දුක් දැඩිවෙයි ගිනි සේ"**

සංසාරේ ඇවිදින අපට නොයෙක් කර්ම විපාක විඳිමට සිදු වේ. ඒ අතර කුසල කර්ම විපාක පිළිබඳ සතුටු වන අපි අකුසල කර්ම විපාක නිසා දුක් වෙමු. හඬමු. වැළපෙමු. මේ කරුම අපටම විතරක් ඇයි දැයි, ප්‍රශ්න කරමු. අප මෙසේ පවසන්නේ කර්මය පිළිබඳ හොඳ අවබෝධයක් නොමැති නිසා බව පෙනේ. රහතන් වහන්සේලා මෙන්ම අප තිලෝගුරු බුදුපියාණන් වහන්සේ ද කර්ම විපාක වලටම මුහුණ දුන් අයුරු ත්‍රිපිටක සූත්‍ර දේශනා පිළිබඳ විමසීමෙන් මනාව පෙනී යයි. ඒ පිළිබඳ විස්තර ඛුද්දක නිකායේ අපදාන පාළියේ පුබ්බකම්ම පිලෝතිකාපදාන සූත්‍රයේ සඳහන් වේ.

බුදුරජාණන් වහන්සේ හිමාල පර්වතය ආසනයේ අනෝතප්ත විල සමීපයේ දී භික්ෂූන් වහන්සේලා පිරිසක් ඇමතූහ. තමන් වහන්සේ අතින් සසර දී සිදු වූ අකුසල කර්ම හා එම කර්ම නිසා සසර විඳි දුක් දොම්නස් මෙන්ම, මේ ආත්ම භාවයේ දී විඳිමට සිදු වූ විපාක පෙන්වා දුන් සේක. එහි සඳහන් වන ආකාරයට බුදුරජාණන් වහන්සේට විඳිමට සිදු වූ විපාක පෙන්වා දුන් සේක. එහි සඳහන් වන ආකාරයට බුදුරජාණන් වහන්සේට විඳිමට සිදුවූ අකුසල කර්ම 12 කි.

## 01. සුන්දරී පරිබ්‍රාජිකාව අවේලාවේ විහාරයට පැමිණීමේ චෝදනාව. (ගණිකාවක් ඇසුරු කිරීමේ චෝදනාව)

බුදුරජාණන් වහන්සේ වැඩ සිටි විහාරස්ථානයට පැමිණ තමා විහාරස්ථානයේ රාත්‍රිය ගතකොට යන බව පවසමින් සුන්දරිය උදේ පාන්දර කෙස් වැටියත් කඩාගෙන පන්සලේ සිට දින කිහිපයක්ම ගමන් කළා ය. මෙය සිදු වුයේ බමුණන්ගේ ඉගැන්වීම මතය. මේ නිසා බුදුරජාණන් වහන්සේ ගණිකාවන් රාත්‍රියට පන්සලට ගෙන්වා ගන්නවාය යනුවෙන් අපහසු විඳිමට සිදු විය.

.පෙර ආත්ම භාවයක දී මුනාලී නමින් දූර්තයෙක් වි ඉපදී සිටින දී සරභූ නම් පසේ බුදුරජාණන් වහන්සේ නමක් දැක උන්වහන්සේට අපහාස කෙළේය. බොරු සිල් පෙන්වන දුසිල්වතෙකි, සොරෙකි, බොරුකාරයෙකි, යනාදිය කියා කෙළෙස් නැති කල උතුමෙකුට නින්දා අපහාස කිරිම නිසා අවුරුදු දහස් ගණනක් නිරයේ දුක්වින්දේ ය. ආත්ම ගණනක් අපහාස වින්දේය. බුද්ධත්වය ලැබූ ආත්මයේ දීත් එසේ නින්දා විඳිමට සිදුවිය.

## 02. චිංචිමානවිකාවගෙන් චෝදනා (ස්ත්‍රී දූෂණ චෝදනාවක්)

දිනක් බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කරමින් සිටින අවස්ථාවේ චිංචිමානවිකාව නැමැති ගර්භණී කාන්තාවක් ඉදිරියට පැමිණියා ය. පැමිණ තම කුස තුළ සිටින දරුවාගේ පියා බුදුරජාණන් වහන්සේ බවත්, එම දරුවා භාරගත යුතු බවත් පැවසීය. මෙහි දී බොහෝ අය කලබල වූහ. ඒ අතර ශක්‍රදෙවියන් මීයකුගේ වේෂයක් මවාගෙන ඇවිත් ගර්භනී කාන්තාවක් ලෙස කුසේ බැඳගෙන සිටි දර මිටියේ ලණුව කැපුවේ ය. එහි දී දරකැලි බිම වැටි ගර්භනියක් සේ කළ බොරුව හෙළි විය. එහි දී සත්‍ය හෙළි විය. එසේ වුවත් උන්වහන්සේට මෙවැනි අපහාසයක් විඳිමට සිදු වූහ.

සබ්බාභිභූ නම් බුදුරජාණන් වහන්සේගේ කාලයේ නන්ද නම් උන්වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේ නමකට බොරුවට අපහාස කෙළේය. බොරු චෝදනාවක් කොට උන්වහන්සේ අපහසුතාවයට පත්කළේය. ඒ පාපය නිසා ආත්ම ගණනක් නිරයේ දුක්වින්දේය. මිනිස් ආත්මවල ඉපදී අභූත චෝදනාවලට ලක්වන්නට සිදුවිය. මේ ආත්මයේ දී මහ පිරිසක් ඉදිරියේ චිංචිමානවිකාවගේ අපහාසයට ලක්විමට සිදුවිය.

## 03. සුන්දරිය මැරීමේ චෝදනාව. (මිනිමරු චෝදනාවක්)

අන්‍යාගාමිකයන් විසින් සුන්දරිය මරා විහාරස්ථානයේ පරමල් හෙළන තැන මිනිය සැඟවිය. මෙහි දී සුන්දරිය මරා විහාරස්ථානයේ මල්ගොඩයට මිනිය සැඟවූ බව පවසමින් බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු සංඝයාට දින සතක් අපහාස විඳීමට සිදුවිය.

පිණ්ඩපාතයේ වඩින විට බොහෝ දෙනා දානය පවා නොදි නින්දා කලේ මිනිමරුවන් බව පවසමිනි. මෙය ඉවසාගත නොහැකි වූ ආනන්ද හිමියන් බුදුරජාණන් වහන්සේගේ "අපි මේ ප්‍රදේශය අතහැර වෙනත් ප්‍රදේශයකට යමුදැයි" විමසිය.

එහි දී බුදුරජාණන් වහන්සේ දේශනා කලේ ආනන්ද එහිදී ද මෙසේ අපට නින්දා කළොත් අපි කොහි යන්නද? මදක් ඉවසන ලෙස දැන්විය. දින සතක් ගතවන විට සත්‍ය හෙළි විය. මිනිමරුවන් කවුරුද යන්න දැනගැනිමෙන් පසු අපහාස කර වූ අය නිහඬ වූහ.

අප බෝධිසත්වයන් වහන්සේ මහත් සෘද්ධි ඇති බමුණු ආත්මයක ඉපිද සිටියේය.ඔහු ඉතා දක්ෂ, බහුශ්‍රැත බමුණෙකි. බොහෝ දෙනා ගරු බුහුමන් කරති. ඔහුට ගෝලයෝ 500 කි. ඔවුන්ට මන්ත්‍ර උගන්වයි. මෙසේ සිටින අතර පඤ්ච අභිඥාලාභී භීමනම් නම් සෘෂිවරයෙකු දැක ඔහුට බොරුකාරයෙක් කියා නින්දා කෙළේය. තම ගෝලයන්ට ද ඒ බව කිය. ගෝලයෝ ද මෙම නින්දා කිරීම අසා සතුටු වූහ. ඔවුන් ද ගෙයක් පාසා පිඬුසිඟා යන අතර භීම සෘෂිවරයා කාමභෝගී කෙනෙක් කියා අපහාස කළෝය. මේ අකුසල කර්මය නිසා සුන්දරි මැරීමේ චෝදනාව බුදුරජාණන් වහන්සේ සමඟ සිටි ගෝලයන්ට ද විඳීමට සිදුවූහ.

## 04. දෙව්දත් තෙර ගල් පෙරලීම.

ගිජ්ජකූට පර්වතය පාමුල සක්මන් කරමින් සිටි බුදුරජාණන් වහන්සේ ඝාතනය කිරීමේ අදහසින් දෙව්දත්තෙර විශාල ගලක් පෙරලිය. මෙහි දී තවත් විශාල ගලක් මතුව ඇවිත් ඒ ගල වැළකිය. නමුත් එහි ගල් පතුරක් ඇවිත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාදයේ වැදී තුවාල විය.

අප බෝධිසත්වයන් වහන්සේ පෙර ආත්මකයක දී මනුෂ්‍යයෙක් වී ඉපදුනේය. ඔහුගේ පියාට බිරින්දෑවරු දෙදෙනෙකි. දෙදෙනාට දරුවන් දෙදෙනෙකි.එක් අම්මා කෙනෙකුට බෝධිසත්වයන් වහන්සේ ද අනෙක් අම්මාට තවත් දරුවෙක් ද සිටියේය. තරුණ වයසට පත් බෝධිසත්වයන් වහන්සේ ධනයට ඇති ආශාව නිසා තම සහෝදරයා මරුමුවට පත් කළේය. සියලු ධනය තමා සතුකර ගැනීමේ අදහසින් සොහොයුරා මරුමුවට පත්කොට ගිරිදුර්ගයක හෙළා ගලකින් වැසිමට කටයුතු කළේය. ඒ අකුසල කර්මය නිසා බුදු වූ ආත්මභාවයේ දිත් දෙව්දත් තෙරුන් වහන්සේගේ ගල්පෙරලීමට මුහුණ දීමටත් තම මාපට ඇඟිල්ල තැලීමටත් ලක්විය.

## 05. දුනුවායන් තමන් වහන්සේට හී වලින් විදීම.

බුදුරජාණන් වහන්සේ ඝාතනය කිරීම පිණිස අජාසත් රජු හා දෙව්දත් තෙර එකතු වී දුනුවායන් එවූහ. ඔවුන් දුනු හී රැගෙන බුදුරජාණන් වහන්සේට ඊතල වලින් විද්දේය. නමුත් උන්වහන්සේට හානියක් කිරීමට නොහැකි විය.

පෙර ආත්ම භාවයක දී අප බෝධිසත්වයන් වහන්සේ කුඩා දරුවෙක් ව උපත ලබා සිටි සේක. ළාබාල වයසේ සිටිය දී තවත් දරුවන් පිරිසක් සමඟ මහමඟ සෙල්ලම් කරමින් සිටින අතරතුර පසේ බුදුරජාණන් වහන්සේ නමක් වඩිනවා දුටුවේය. උන්වහන්සේ දැක මේ දරුවා ගල් කැටයක් ගෙන බුදුරජාණන් වහන්සේ දැක මේදරුවා ගල් කැටයක් ගෙන බුදුරජාණන් වහන්සේ දෙසට දමා ගැසුවේය. ඒ අකුසල කර්මය නිසා අවුරුදු දහස් ගණනක් නිරයේ දුක්වින්දේය. බුද්ධත්වය ලැබූ ආත්මයේ දී දෙව්දත් තෙරුන්ගේ මෙහෙයවීම නිසා දුනුවායන් තමන් වහන්සේ පරිනිර්වාණයට පත්කිරීමට උත්සාහ කළේය.

## 06. නාලාගිරි ඇතු තමා මැරීමට පැමිණීම.

තමාට බුදුබව ලබාගැනීමට නම් බුදුරජාණන් වහන්සේ ඝාතනය කළ යුතු යැයි සිතු දෙව්දත් තෙරුන් වහන්සේ නාලාගිරි ඇතාට රා කල දහසයක් පොවා මත් කොට බුදුරජාණන් වහන්සේ ඉදිරියට එවීය. එහෙත් නාලාගිරි ඇතා පැමිණ බුදුරජාණන් වහන්සේ ඉදිරියේ දමනය විය.

අප බෝධිසත්වයන් වහන්සේ පෙර ආත්ම භාවයක දී හස්ති පාලකයෙක් වී (ඇත්ගොව්වෙකු) ඉපද සිටියේය.ඔහු දිනක් හස්තින් රැගෙන පාරේ යන අවස්ථාවේ පසේ බුදුරජාණන් වහන්සේ නමක් පිණ්ඩපාතේ වඩිනවා දුටුවේය. ඒ දැක හස්තියා පසේ බුදුරජාණන් වහන්සේ දෙසට මෙහෙයවීය. ඒ අකුසල කර්මය නිසා ආත්ම ගණනක් අපායේ දුක් විඳින්නට සිදුවිය. බුදු වූ ආත්මභවයේ දී ද බුදුරජාණන් වහන්සේට ගිරිබ්බජ නම් නගරයේ දී නාලාගිරි නම් දරුණු ඇතාගේ හිරිහැරයට ලක්වන්නට සිදු වුහ.

**(මෙහි කර්ම විපාක 06 ක් පිළිබඳ විස්තර ඇති අතර ඉතිරි කර්ම විපාක 06 පිළිබඳ විස්තර ඊළඟ කලාපයෙන් බලාපොරොත්තු වන්න)**